64515



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

33 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ.
- **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

විභාග අංකය : ................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති.ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** පහත දැක්වෙන කුමන ප්‍රකාශය, ආයතනයක ගිණුම්කරණයේ මූලික පරමාර්ථය **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
(1) නිශ්චිත කාලයක් තුළ සිදු වූ ගණුදෙනු වාර්තා කිරීම.
(2) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගණුදෙනු සටහන් කිරීම.
(3) කළමනාකරුවන්ගේ භාවිතය සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම.
(4) ප්‍රාග්ධන සපයන්නන් සඳහා පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
(5) ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු සැපයීම. (......)

**2.** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට මාස 12 ක් ඇතුළත දිගුකාලීන ණයවලින් ගෙවිය යුතු කොටස, ජංගම වගකීමක් ලෙස වර්ග කිරීම සඳහා පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
(1) උපචිත (2) සංගතතා (3) අඛණ්ඩ පැවැත්ම
(4) ගැළපුම් (5) විචක්ෂණ (......)

**3.** ආයතනයක් සතු යන්ත්‍රයක ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය වසර 10 සිට වසර 8 දක්වා සංශෝධනය කරන ලද අතර, මෙම සංශෝධනය මත ගණනය කළ ක්ෂය ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගන්නා ලදී. මෙම හඳුනා ගැනීම සඳහා පදනම් වන්නේ පහත කුමන ගිණුම්කරණ සංකල්පය ද?
(1) ප්‍රමාණාත්මක බව (2) ගැළපුම් (3) ඓතිහාසික පිරිවැය
(4) අනාවරණ (5) යථාරූපී (......)

- **අංක 4 සිට 6 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2021.03.01 දින සීමිත මංගල පොදු සමාගම පරිපාලන කටයුතු සඳහා භාවිත කිරීමට රු. 500 000 කට කාර්යාල උපකරණයක් ණයට මිල දී ගන්නා ලදී. 2021.03.02 දින සමාගම විසින් මෙම උපකරණය ස්ථාපනය කිරීම සඳහා රු. 20 000 ක් මුදලින් ගෙවන ලදී. මෙම කාර්යාල උපකරණ ණය, සමාන මාසික වාරික 10 කින් ගෙවිය යුතු වේ. 2021.03.31 දින ප්‍රථම වාරිකය වූ රු. 60 000 ක් ගෙවූ අතර, එහි රු. 10 000 ක පොලියක් ද ඇතුළත් විය.

**4.** 2021.03.31 දිනට මෙම ගනුදෙනුවල **ශුද්ධ බලපෑම** පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

| | වත්කම් (රු.' 000) | = | වගකීම් (රු.' 000) | + | හිමිකම (රු.' 000) |
|---|---|---|---|---|---|
| (1) | + 420 | | + 440 | | - 20 |
| (2) | + 420 | | + 450 | | - 30 |
| (3) | + 440 | | + 440 | | 0 |
| (4) | + 440 | | + 450 | | - 10 |
| (5) | + 460 | | + 470 | | - 10 |

(......)

[දෙවැනි පිටුව බලන්න.

**5.** 2021.03.31 දින ගෙවන ලද ප්‍රථම ණය වාරිකය සටහන් කිරීම සඳහා **නිවැරදි** ද්විත්ව සටහන කුමක් ද?

| | ගිණුම් | හර (රු.' 000) | බැර (රු.' 000) |
|---|---|---|---|
| (1) | කාර්යාල උපකරණ ණය | 50 | |
| | මුදල් | | 50 |
| (2) | කාර්යාල උපකරණ ණය | 60 | |
| | මුදල් | | 60 |
| (3) | කාර්යාල උපකරණ ණය | 50 | |
| | කාර්යාල උපකරණ | 10 | |
| | මුදල් | | 60 |
| (4) | කාර්යාල උපකරණ ණය | 50 | |
| | පොලී වියදම් | 10 | |
| | මුදල් | | 60 |
| (5) | කාර්යාල උපකරණ ණය | 60 | |
| | පොලී වියදම් | 10 | |
| | මුදල් | | 60 |
| | ගෙවිය යුතු පොලී | | 10 |

(……)

**6.** කාර්යාල උපකරණයෙහි පිරිවැය සටහන් කිරීමට භාවිත කරන මූලික ලියවිල්ල/ලියවිලි සහ මූලික සටහන් පොත/පොත් කවරේ ද?

| | මූලික ලියවිල්ල/ලියවිලි | මූලික සටහන් පොත/පොත් |
|---|---|---|
| (1) | ගැනුම් ඉන්වොයිසිය | ගැනුම් ජර්නලය |
| (2) | ගැනුම් ඉන්වොයිසිය | පොදු ජර්නලය |
| (3) | ජර්නල් වවුචරය | පොදු ජර්නලය |
| (4) | ගැනුම් ඉන්වොයිසිය සහ ගෙවීම් වවුචරය | ගැනුම් ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය |
| (5) | ජර්නල් වවුචරය සහ ගෙවීම් වවුචරය | පොදු ජර්නලය සහ මුදල් ගෙවීම් ජර්නලය |

(……)

- **අංක 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ආයතනයක් රු. 100 000 ක් මුදලින් ආයෝජනය කරමින් 2021.01.01 දින සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ආයතනය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත. ගැනුම් සහ විකුණුම් තුළ 8% ක් VAT ඇතුළත් වේ. 2021.01.31 දිනෙන් අවසන් මාසය තුළදී පහත ගනුදෙනු සිදු විය.

* රු. 540 000 ක භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී.
* මෙම සියලුම භාණ්ඩ රු. 648 000 කට ණයට විකුණන ලදී.
* ණයගැතියන්ගෙන් රු. 500 000 ක් ලැබුණි.
* රු. 20 000 ක වට්ටමකට යටත්ව රු. 360 000 ක් වූ ණයහිමියන් පියවන ලදී.

**7.** 2021.01.31 දිනෙන් අවසන් මාසය සඳහා දළ ලාභය සහ 2021.01.31 දිනට මුදල් ගිණුමේ ශේෂය කොපමණ ද?

| | දළ ලාභය (රු.' 000) | මුදල් ගිණුමේ ශේෂය (රු.' 000) |
|---|---|---|
| (1) | 100 | 160 |
| (2) | 100 | 240 |
| (3) | 100 | 260 |
| (4) | 108 | 160 |
| (5) | 108 | 260 |

(……)

**8.** 2021.01.31 දිනට ව්‍යාපාරයේ මුළු වගකීම් සහ හිමිකම කොපමණ ද?

| | මුළු වගකීම් (රු.' 000) | හිමිකම (රු.' 000) |
|---|---|---|
| (1) | 180 | 120 |
| (2) | 180 | 220 |
| (3) | 188 | 220 |
| (4) | 188 | 228 |
| (5) | 200 | 228 |

(……)

[තුන්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**9.** මිහිනදී ට්‍රේඩර්ස් තනි පුද්ගල ව්‍යාපාරයකි. සේවක අර්ථසාධක අරමුදලට (EPF) මෙම ආයතනයේ සේව්‍ය හා සේවක දායකත්වයන් පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරය ගෙවූ ශුද්ධ වැටුප රු. 1 800 000 ක් වේ. EPF සඳහා සේවක දායකත්වය, දළ වැටුපෙන් කෙරෙන එකම අඩු කිරීම වේ. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැටුප් වියදම සහ EPF වියදම කොපමණ ද?

| | වැටුප් වියදම (රු.' 000) | EPF වියදම (රු.' 000) |
|---|---|---|
| (1) | 1 800 | 270 |
| (2) | 1 800 | 300 |
| (3) | 2 000 | 300 |
| (4) | 2 000 | 500 |
| (5) | 2 400 | 360 |

(......)

**10.** තනි පුද්ගල ව්‍යාපාරයක් වන අරලිය එන්ටර්ප්‍රයිසස් 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළිවෙළින් රු. 765 000 ක සහ රු. 540 000 ක දළ ලාභයක් සහ ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී. වර්ෂය තුළ රු. 65 000 ක තොග හානි වී ඇත. 2021.03.31 දිනට ව්‍යාපාරයේ පැවති භෞතික තොගය මත අවසාන තොගය ආගණනය කර ඇත. කෙසේ වුව ද, තොග හානි වීම සම්බන්ධව ගිණුම් පොත්වල කිසිදු සටහනක් තබා නොමැත. තොග හානිය ගැළපූ පසු **නිවැරදි** දළ ලාභය සහ ශුද්ධ ලාභය කොපමණ ද?

| | දළ ලාභය (රු.'000) | ශුද්ධ ලාභය (රු.'000) |
|---|---|---|
| (1) | 700 | 475 |
| (2) | 700 | 540 |
| (3) | 765 | 475 |
| (4) | 830 | 540 |
| (5) | 830 | 605 |

(......)

**11.** 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මිහිරානි බේකරියේ ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.' 000 |
|---|---|
| 2020.04.01 දිනට අමුද්‍රව්‍ය තොගය | 100 |
| 2021.03.31 දිනට අමුද්‍රව්‍ය තොගය | 70 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 130 |
| වර්ෂය තුළ නොනිමි තොගයේ වැඩි වීම | 15 |
| සෘජු ශ්‍රම පිරිවැය | 70 |
| නිෂ්පාදන ඒකක මත පුරස්කාර ගෙවීම් | 30 |
| කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය | 35 |

මුළු නිෂ්පාදන පිරිවැය මත පදනම්ව නොනිමි තොගය අගය කෙරේ.
2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

| | ප්‍රාථමික පිරිවැය (රු.'000) | මුළු නිෂ්පාදන පිරිවැය (රු.'000) |
|---|---|---|
| (1) | 200 | 220 |
| (2) | 200 | 250 |
| (3) | 215 | 250 |
| (4) | 260 | 280 |
| (5) | 260 | 310 |

(......)

**12.** සුනිමල් ට්‍රේඩර්ස් නිසි ආකාරයට ගිණුම් පොත් පවත්වා නොගනී. පහත තොරතුරු 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වේ.

| | රු.' 000 |
|---|---|
| 2020.04.01දිනට තොගය | 140 |
| 2021.03.31දිනට තොගය | 170 |
| විකුණුම් | 1 050 |
| ආපසු යැවුම් | 50 |
| ගෙනඒමේ කුලී | 40 |

සුනිමල් ට්‍රේඩර්ස් විකුණුම් මිල මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව භාණ්ඩ අලෙවි කරනු ලබයි. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගැනුම් කොපමණ ද?

(1) රු. 840 000 (2) රු. 880 000 (3) රු. 915 000
(4) රු. 920 000 (5) රු. 955 000

(......)

[හතරවැනි පිටුව බලන්න.

**13.** 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සරණ සුභසාධක සංගමයට අදාළව පහත තොරතුරු ලබා දී ඇත.

| **විස්තරය** | **රු.' 000** |
|---|---|
| 2020.01.01 දිනට ලැබිය යුතු සාමාජික මුදල් | 192 |
| 2020.01.01 දිනට ඉදිරියට ලද සාමාජික මුදල් | 60 |
| ප්‍රවර්තන වර්ෂය තුළදී ලද සාමාජික මුදල්: | |
| 2019 වර්ෂය සඳහා | 144 |
| 2020 වර්ෂය සඳහා | 1 092 |
| 2021 වර්ෂය සඳහා | 108 |
| 2020.12.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල් | 96 |

2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම:

(1) රු. 1 092 000 (2) රු. 1 200 000 (3) රු. 1 308 000
(4) රු. 1 344 000 (5) රු. 1 488 000 (……)

**14.** 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතෙහි 24 වගන්තියට අනුව පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - හවුල්කරුවන් හවුල් ව්‍යාපාරයට ලබාදුන් ණය සඳහා 5% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
B - හවුල්කරුවන් විශ්‍රාම යන අවස්ථාවේදී ගෙවිය යුතු මුදල පියවා නොමැති විට ඔවුන් ඒ සඳහා 5% ක වාර්ෂික පොලියකට හිමිකම් ලබයි.
C - හවුල්කරුවන් කළමනාකරණය සඳහා දායක වූ විට ඔවුන් වැටුප් සඳහා හිමිකම් ලබයි.
D - හවුල් ව්‍යාපාරයේ වියදමක් හවුල්කරුවන්ගේ පෞද්ගලික මුදලින් ගෙවා ඇති විට, එය ප්‍රතිපූරණය කිරීමට ඔවුන් හිමිකම් ලබයි.

(1) A හා C පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි.
(4) A, B හා D පමණි. (5) B, C හා D පමණි. (……)

● **අංක 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

අමල් හා සමන් පිළිවෙළින් 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. 2020.03.31 දිනට ඔවුන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂ පහත පරිදි වේ.

| | **අමල් (රු.'000)** | **සමන් (රු.'000)** |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් ශේෂය | 300 | 200 |
| ජංගම ගිණුම් ශේෂය | 60 | 50 |

හවුල්කරුවන්ට වැටුප් සහ ප්‍රාග්ධන පොලී ගෙවනු නොලැබේ. 2021.03.31 දින මලික් නව හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට බඳවා ගන්නා ලදී. මලික් ප්‍රාග්ධනය ලෙස රු. 500 000 කින් දායක විය. අමල්, සමන් සහ මලික් අතර නව ලාභාලාභ අනුපාතය පිළිවෙළින් 3 : 2 : 1 ක් වේ. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයෙහි ශුද්ධ ලාභය රු. 150 000 ක් විය. හවුල් ව්‍යාපාරයෙහි කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපනු ලබයි. වර්ෂය තුළ ගැනිලි සිදු කර නොමැත.

2021.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ (කීර්තිනාමය සහ මලික්ගේ ප්‍රාග්ධන දායකත්වය ගැළපීමෙන් පසුව) පහත පරිදි විය.

| **හවුල්කරු** | **අමල්** | **සමන්** | **මලික්** |
|---|---|---|---|
| **ශේෂය (රු.'000)** | 330 | 220 | 450 |

**15.** 2021.03.31 දිනට හවුල් ව්‍යාපාරයෙහි ඇස්තමේන්තු කරන ලද කීර්තිනාමය කොපමණ ද?

(1) රු. 50 000 (2) රු. 250 000 (3) රු. 300 000
(4) රු. 500 000 (5) රු. 750 000 (……)

**16.** 2021.03.31 දිනට ව්‍යාපාරයෙහි හිමිකම සහ අමල්ගේ ජංගම ගිණුමේ ශේෂය කොපමණ ද?

| | **හිමිකම (රු.'000)** | **අමල්ගේ ජංගම ගිණුමේ ශේෂය (රු.'000)** |
|---|---|---|
| (1) | 1 000 | 135 |
| (2) | 1 000 | 150 |
| (3) | 1 235 | 135 |
| (4) | 1 260 | 110 |
| (5) | 1 260 | 150 |

(……)

[පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**17.** හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුව ගණනය කරන, ඒකකයක තොග පිරිවැය වෙනස්වීමට පහත කුමන සාධක බලපානු ලබයි ද?

A - ගැනුම් මිල
B - මිලදී ගන්නා ලද ප්‍රමාණය
C - නිකුත් කරන ලද ප්‍රමාණය
D - ආරම්භක තොගයේ පිරිවැය

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) C හා D පමණි.
(4) A, B හා D පමණි.
(5) A, B, C හා D යන සියල්ලම ය. (......)

**18.** සීමිත මධුෂිකා පොදු සමාගම 2016.04.01 දින සංස්ථාපනය කරන ලදී. සමාගම එහි ඉඩම් 2019.03.31 දින ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එයින් රු. 500 000 ක අතිරික්තයක් ඇති විය. 2021.03.31 දින ඉඩම් නැවත ප්‍රත්‍යාගණනය කළ අතර, එයින් රු. 300 000 ක ඌනතාවක් ඇති විය. තව ද සමාගම එහි කාර්යාල උපකරණ 2021.03.31 දින ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කරන ලද අතර, එයින් රු. 800 000 ක ඌනතාවක් ඇති විය.

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව 2021.03.31 දින ඇති වූ ප්‍රත්‍යාගණන ඌනතාවන් සඳහා වන **නිවැරදි** ගිණුම්කරණ පිළිවෙත:

(1) රු. 1 100 000 ක් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනීම
(2) රු. 1 100 000 ක් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනීම
(3) රු. 300 000 ක් ලාභ හෝ අලාභ තුළ සහ රු. 800 000 ක් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනීම
(4) රු. 600 000 ක් ලාභ හෝ අලාභ තුළ සහ රු. 500 000 ක් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනීම
(5) රු. 800 000 ක් ලාභ හෝ අලාභ තුළ සහ රු. 300 000 ක් වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගැනීම (......)

**19.** LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව පහත කුමන අවස්ථාවේදී/අවස්ථාවන්හිදී සමාගමක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ප්‍රතිපාදනයක් හඳුනාගනු ලබන්නේ ද?

A - වසරක වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකිණීම
B - දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම
C - විකුණන ලද දෝෂ සහිත භාණ්ඩ අලුත්වැඩියා කිරීමට අතීත පරිචයට අනුව භාර ගැනීම

(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) A හා C පමණි.
(5) A, B හා C යන සියල්ලම ය. (......)

**20.** LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව පහත කුමන අවස්ථාව/අවස්ථා ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක් ලෙස සලකනු ලබන්නේ ද?

A - ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට වෙනස් කිරීම
B - තොග අගය කිරීමට යොදාගනු ලබන පිරිවැය සූත්‍රය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයේ සිට පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමයට වෙනස් කිරීම
C - දේපළ, පිරියත සහ උපකරණ පන්තියක මිනුම් කිරීමේ පදනම, පිරිවැය ආකෘතියේ සිට ප්‍රත්‍යාගණන ආකෘතියට වෙනස් කිරීම

(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C යන සියල්ලම ය. (......)

**21.** සීමිත රොෂාන් පොදු සමාගම 2020.04.01 දින වසර 4 ක කාලසීමාවක් සඳහා මෝටර් රථයක භාවිත අයිතිය ලබා ගැනීමට කල්බදු ගිවිසුමකට එළඹෙන ලදී. මෙදින මූලික ගෙවීම ලෙස රු. 1 500 000 ක් ගෙවන ලදී. මෙදින කල්බදු වගකීමෙහි මූලික මිනුම් කිරීම රු. 3 500 000 ක් විය. කල්බදු ගිවිසුමට අනුව කල්බදු කාලසීමාව අවසානයේදී මෙම වත්කමෙහි නීත්‍යානුකූල අයිතිය සීමිත රොෂාන් පොදු සමාගමට මාරු කරනු ලබයි. මෙම මෝටර් රථයෙහි ඵලදායී ජීව කාලය වසර 5 කි.

SLFRS 16 (කල්බදු) ප්‍රමිතයට අනුව 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම මෝටර් රථයේ ක්ෂය කොපමණ ද?

(1) රු. 400 000
(2) රු. 700 000
(3) රු. 875 000
(4) රු. 1 000 000
(5) රු. 1 250 000 (......)



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

- **අංක 22 සහ 23 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සීමිත සමන් පොදු සමාගමේ 2020.04.01 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හා රඳවාගත් ඉපැයුම් පිළිවෙළින් රු. 8 000 000 ක් සහ රු. 2 000 000 ක් විය. මෙම සමාගමේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් මුළු ආදායම සහ මුළු වියදම පිළිවෙළින් රු. 3 000 000 ක් සහ රු. 1 800 000 ක් විය. වර්ෂය සඳහා හඳුනාගත් මුළු වියදම තුළ යන්ත්‍ර දෙවන වර ප්‍රත්‍යාගණනය තුළින් ඇති වූ රු. 600 000 ක ඌනතාවක් ඇතුළත් වේ. 2018.03.31 දින එම යන්ත්‍ර ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය තුළින් රු. 400 000 ක අතිරික්තයක් ඇති වී තිබුණි. ප්‍රවර්තන වර්ෂය තුළ රු. 500 000 ක අතුරු ලාභාංශ ගෙවා ඇති අතර, රු. 800 000 ක අවසන් ලාභාංශයක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021.05.01 දින යෝජනා කර ඇත. වර්ෂය තුළ කොටස් ප්‍රාග්ධනයේ වෙනසක් සිදු වී නොමැත.

**22.** 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය සහ මුළු විස්තීරණ ආදායම:

| | වර්ෂය සඳහා ලාභය (රු.'000) | මුළු විස්තීරණ ආදායම (රු.'000) |
|---|---|---|
| (1) | 800 | 1 200 |
| (2) | 1 200 | 800 |
| (3) | 1 200 | 1 600 |
| (4) | 1 600 | 1 200 |
| (5) | 1 800 | 1 200 |

(……)

**23.** 2021.03.31 දිනට රඳවාගත් ඉපැයුම් සහ හිමිකම:

| | රඳවාගත් ඉපැයුම් (රු.'000) | හිමිකම (රු.'000) |
|---|---|---|
| (1) | 2 300 | 10 300 |
| (2) | 2 700 | 10 700 |
| (3) | 3 100 | 11 100 |
| (4) | 3 300 | 11 300 |
| (5) | 3 600 | 11 100 |

(……)

- **අංක 24 සහ 25 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2020.04.01 දින සංස්ථාපනය කරන ලද සීමිත ඩෙල්ටා පොදු සමාගමට පහත තොරතුරු අදාළ වේ.

| **2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | රු.' 000 |
|---|---|
| බදු පෙර ලාභය | 1 080 |
| වර්ෂය සඳහා ආදායම් බදු | 80 |
| පොලී වියදම් | 160 |
| සාමාන්‍ය කොටස්කරුවන්ට ගෙවූ ලාභාංශ | 300 |
| **2021.03.31 දිනට හිමිකම:** | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් (කොටසක් රු. 20 බැගින්) | 10 000 |
| රඳවාගත් ඉපැයුම් | 700 |

**24.** සීමිත ඩෙල්ටා පොදු සමාගමේ කොටසක ඉපැයුම සහ කොටසක ලාභාංශය:

| | කොටසක ඉපැයුම (රු.) | කොටසක ලාභාංශය (රු.) |
|---|---|---|
| (1) | 1.68 | 0.03 |
| (2) | 2.00 | 0.03 |
| (3) | 2.00 | 0.60 |
| (4) | 2.16 | 0.03 |
| (5) | 2.16 | 0.60 |

(……)

**25.** සීමිත ඩෙල්ටා පොදු සමාගමේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය:

| | හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය (%) | පොලී ආවරණ අනුපාතය (වාර) |
|---|---|---|
| (1) | 9.09 | 6.25 |
| (2) | 9.35 | 6.75 |
| (3) | 9.35 | 7.75 |
| (4) | 10.00 | 6.25 |
| (5) | 10.00 | 7.75 |

(……)

[හත්වැනි පිටුව බලන්න.

**26.** පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ පිරිවැය වර්ගීකරණය සම්බන්ධයෙන් **නිවැරදි** වේ ද?

A - සියලුම සෘජු පිරිවැය, විචල්‍යය පිරිවැය වේ

B - සියලුම වක්‍ර පිරිවැය, ස්ථාවර පිරිවැය වේ

C - සියලුම පොදුකාර්ය පිරිවැය, වක්‍ර පිරිවැය වේ

D - සියලුම සෘජු පිරිවැය, නිෂ්පාදිත පිරිවැය වේ

(1) A පමණි. (2) C පමණි. (3) A හා B පමණි.
(4) C හා D පමණි. (5) B, C හා D පමණි. (......)

**27.** නිෂ්පාදන ව්‍යාපාරයක් විසින් භාවිත කෙරෙන අමුද්‍රව්‍යයක යළි ඇණවුම් මට්ටම සහ යළි ඇණවුම් ප්‍රමාණය පිළිවෙළින් කිලෝග්‍රෑම් 2 000 ක් සහ කිලෝග්‍රෑම් 5 000 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ සතියක අවම පරිභෝජනය කිලෝග්‍රෑම් 200 ක් වේ. මෙම අමුද්‍රව්‍යයේ අවම සහ උපරිම පොරොත්තු කාලය පිළිවෙළින් සති 3 ක් සහ සති 5 ක් වේ.

මෙම අමුද්‍රව්‍යයේ උපරිම තොග මට්ටම:

(1) කිලෝග්‍රෑම් 5 000 (2) කිලෝග්‍රෑම් 5 800 (3) කිලෝග්‍රෑම් 6 100
(4) කිලෝග්‍රෑම් 6 400 (5) කිලෝග්‍රෑම් 7 000 (......)

**28.** පිරිවැය ඒකකයක් සඳහා පොදුකාර්ය පිරිවැය හඳුනාගැනීමේදී අනුගමනය කරන පියවර පහත දී ඇත. මෙම පියවරයන්හි **නිවැරදි** අනුපිළිවෙළ කුමක් ද?

A - පොදුකාර්ය පිරිවැය ප්‍රතිපාදනය කිරීම

B - පොදුකාර්ය පිරිවැය රැස් කිරීම

C - පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම

D - පොදුකාර්ය පිරිවැය විභජනය කිරීම

(1) A, B, C, D (2) A, B, D, C (3) B, A, C, D
(4) B, A, D, C (5) C, D, A, B (......)

**29.** සමාගමක සමච්ඡේද ලක්ෂ්‍යය ඒකක 6 000 කි. ඒකකයක විකුණුම් මිල සහ මුළු ස්ථාවර පිරිවැය පිළිවෙළින් රු. 200 ක් සහ රු. 480 000 ක් වේ.

ඒකකයක විචල්‍ය පිරිවැය සහ ඒකක 8 000 ක් විකුණන විට සමාගමේ ලාභය:

| | **ඒකකයක විචල්‍ය පිරිවැය (රු.)** | **ලාභය (රු.)** |
|---|---|---|
| (1) | 80 | 160 000 |
| (2) | 80 | 480 000 |
| (3) | 120 | 160 000 |
| (4) | 120 | 240 000 |
| (5) | 120 | 480 000 |

(......)

**30.** සීමිත අමරා පොදු සමාගම නව ව්‍යාපෘතියක් සඳහා යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. මෙම නව යන්ත්‍රයේ ගැනුම් මිල රු. 3 000 000 ක් වන අතර, එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු. 500 000 ක් වේ. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත බදු පසු ලාභය පහත පරිදි වේ.

| **වර්ෂය** | **1** | **2** | **3** | **4** | **5** |
|---|---|---|---|---|---|
| **බදු පසු ලාභය (රු.'000)** | 250 | 750 | 500 | 1 000 | 1 000 |

මෙම ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය:

(1) වසර 2.5 (2) වසර 3 (3) වසර 4 (4) වසර 4.5 (5) වසර 5 (......)

[අටවැනි පිටුව බලන්න.

● **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

**31.** ව්‍යාපාරයක ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - ලාභ අරමුණින් පවත්වාගෙන යනු ලබන සෑම ව්‍යාපාරයක්ම ගිණුම්කරණ ප්‍රමිත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. | .................. |
| B - පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන මූලික වශයෙන් ව්‍යාපාරයක අරමුදල් සපයන්නන්ගේ තොරතුරු අවශ්‍යතාවන් පිළිබඳව අවධානය යොමුකරමින් පිළියෙළ කරනු ලබයි. | .................. |
| C - ව්‍යාපාරයකට බලපාන පරිසර සාධකවල වෙනස්වීම්වලට අනුකූලව එහි මූල්‍ය වාර්තාවල අන්තර්ගතය වෙනස් විය හැක. | .................. |
| D - ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියේ ආරම්භක පියවර වන්නේ ගනුදෙනු හඳුනාගැනීමයි. | .................. |

**32.** පොල්තෙල් නිෂ්පාදනය කරනු ලබන ව්‍යාපාරයක පහත ගනුදෙනු හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්නුම් කරන හිමිකම් ශේෂය **වැඩි වේ** ද, **අඩු වේ** ද, **වෙනස් නොවේ** ද යන්න සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **හිමිකමට සිදුවන බලපෑම (වැඩි වේ/ අඩු වේ/ වෙනස් නොවේ)** |
|---|---|
| A - පොල් ණයට මිල දී ගැනීම | ...................................... |
| B - ලාභයක් සහිතව පොල්තෙල් ණයට විකිණීම | ...................................... |
| C - වට්ටමකට යටත්ව පොල් සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම | ...................................... |
| D - අයිතිකරු විසින් පෞද්ගලික භාවිතය සඳහා පොල්තෙල් ලබා ගැනීම | ...................................... |

**33.** මධුර සහල් ඇඹරුම්හලෙහි සිදුවූ පහත එක් එක් ගනුදෙනුව සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලික සටහන් පොත සඳහන් කරන්න.

| **ගනුදෙනුව** | **මූලික සටහන් පොත** |
|---|---|
| A - ගොවීන්ගෙන් අත්පිට මුදලට වී මිල දී ගැනීම | ...................................... |
| B - හාල් සැකසීමේ යන්ත්‍රයක් ණයට මිල දී ගැනීම | ...................................... |
| C - තොග වෙළෙඳුන්ට සහල් ණයට විකිණීම | ...................................... |
| D - සත්ව ආහාර නිෂ්පාදනය කරන්නන්ට කැඩුණු සහල් ණයට විකිණීම | ...................................... |

**34.** 2021.03.31 දිනට ව්‍යාපාරයක ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 560 000 ක් වූ අතර, මෙම ශේෂය එදිනට ණයගැති ලෙජරයේ ශේෂවල එකතුවට සමාන නොවී ය. පසුව කරන ලද විමර්ශනයේදී පහත දෑ හෙළිදරව් විය.

- ණයගැති ලෙජරයෙහි බොල් ණය ලෙස කපාහල රු. 20 000 ක ණයගැති ශේෂයක් ණයගැති පාලන ගිණුමට පිටපත් කර නොතිබුණි.
- රු. 42 000 ක විකුණුම් ඉන්වොයිසියක් රු. 24 000 ක් ලෙස විකුණුම් ජර්නලයේ සටහන් වී තිබුණි. කෙසේ වුව ද මෙය නිවැරදිව ණයගැති ලෙජරයේ සටහන් වී තිබුණි.

2021.03.31 දිනට පහත දෑ හඳුනාගන්න.

(අ) ඉහත වැරදි **නිවැරදි කිරීමට පෙර** ණයගැති ලෙජරයේ ශේෂවල එකතුව : රු. ........................

(ආ) ඉහත වැරදි **නිවැරදි කිරීමෙන් පසු** ණයගැති පාලන ගිණුමේ සංශෝධිත ශේෂය : රු. ........................

[නවවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**35.** අමල් ට්‍රේඩර්ස්හි පහත දී ඇති ආදායම් ප්‍රකාශනයේ A, B, C සහ D යන අක්ෂරවලින් දක්වා ඇති එක් එක් අයිතමයට අදාළ වන ගිණුම්කරණ සංකල්පය හඳුනාගන්න.

අමල් ට්‍රේඩර්ස් ← A

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය ← B

**රු.'000** ← C

| | | |
|---|---|---|
| විකුණුම් | XXXX | } ← D |
| විකුණුම් පිරිවැය | (XXX) | |
| දළ ලාභය | XXX | |

A ................................................ B ................................................

C ................................................ D ................................................

**36.** තනි පුද්ගල ව්‍යාපාරයක ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද (**T**) **අසත්‍ය** ද (**F**) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - ව්‍යාපාරයේ ලාභය මුදල් ගැනිලි ලෙස බෙදාහැරිය හැක. | .................. |
| B - අයිතිකරුට විකුණන ලද භාණ්ඩ ව්‍යාපාරයේ විකුණුම් ලෙස ගිණුම් ගත කෙරේ. | .................. |
| C - භාණ්ඩ පරිත්‍යාග, ව්‍යාපාරයේ වියදමක් ලෙස හඳුනාගත යුතු ය. | .................. |
| D - මුදල් පදනම මත ගනුදෙනු සටහන් කරන විට ආදායම් ප්‍රකාශනයක් පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. | .................. |

**37.** තනි පුද්ගල ව්‍යාපාරයක් වන පියනදී ට්‍රේඩර්ස් විසින් 'විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම' මත භාණ්ඩ විකුණනු ලබයි. නියෝජිතයාට භාණ්ඩ යැවූ දින සිට දින 30 ක කාලයක් ඇතුළත නොවිකිණී ඇති භාණ්ඩ ආපසු එවිය යුතු වේ. 2021.03.15 වන දින පිරිවැය රු. 500 000 ක් වූ භාණ්ඩ නියෝජිතයෙකුට යවන ලදී. මෙම භාණ්ඩවල විකුණුම් මිල රු. 700 000 කි. 2021.03.31 දින වන විට නියෝජිතයාට විකිණීමට හැකි වූයේ මෙම භාණ්ඩවලින් 60% ක් පමණි. 2021.03.31 දිනට නියෝජිතයා සන්තකයෙහි තිබූ තොගවල ශුද්ධ උපලබ්ධි අගය රු. 210 000 ක් විය.
ඉහත ගනුදෙනුවට අදාළව පියනදී ට්‍රේඩර්ස් සඳහා පහත දෑ සඳහන් කරන්න.

(අ) 2021.03.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් අයභාරය : රු. ........................

(ආ) 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කළ තොගයේ අගය : රු. ........................

● **අංක 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

මංජුලා සහ සංජුලා ලාභාලාභ සමානව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2020.04.01 දින අංජුලා හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලද අතර, ඇය ප්‍රාග්ධනය සහ කීර්තිනාම කොටස යන දෙකම සඳහා මුදල් රැගෙන එන ලදී. මෙදින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 000 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපනු ලබයි. මංජුලා, සංජුලා සහ අංජුලා අතර ලාභාලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙළින් 5 : 3 : 2 ක් ලෙස එකඟ විය. අතිරේක තොරතුරු පහත දී ඇත.

| | **මංජුලා (රු.'000)** | **සංජුලා (රු.'000)** | **අංජුලා (රු.'000)** |
|---|---|---|---|
| 2020.04.01 දිනට ප්‍රාග්ධන ගිණුම් ශේෂ, (කීර්තිනාමය ගැළපීමෙන් පසු) | 5 000 | 3 200 | 1 800 |
| **2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:** | | | |
| - ලාභ කොටස් | 1 000 | 600 | 400 |
| - හවුල්කරුවන්ගේ වේතන | 800 | 800 | 600 |

**38.** මංජුලා, සංජුලා සහ අංජුලා හවුල් ව්‍යාපාරය සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) 2020.04.01 දින අංජුලා රැගෙන ආ මුදල : රු.'000 ........................

(ආ) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය : රු.'000 ........................

[දහවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**39.** මංජුලාට විසර්ජනය කරන ලද මුළු ලාභය සහ සංජුලාට විසර්ජනය කරන ලද වේතනය සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් ලියන්න.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| (අ) ............................................ ............................................ (මංජුලාට විසර්ජනය කරන ලද මුළු ලාභය) | ................ | ................ |
| (ආ) ............................................ ............................................ (සංජුලාට විසර්ජනය කරන ලද වේතනය) | ................ | ................ |

**40.** LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව ඇඟලුම් නිෂ්පාදන සමාගමක පහත එක් එක් මුදල් ප්‍රවාහය වර්ගීකරණය කරන්න.

| | මුදල් ප්‍රවාහය | වර්ගීකරණය |
|---|---|---|
| A - | හිමිකම් නිකුතුවකින් ලද මුදල් | ........................................ |
| B - | වෙනත් සමාගම්වල කොටස් ආයෝජන සඳහා ලද ලාභාංශ | ........................................ |
| C - | වෙළෙඳ ණයහිමියෙකුට ගෙවිය යුතු මුදල පියවීම | ........................................ |
| D - | කල්බද්දක මූලික ගෙවීම සිදුකිරීම | ........................................ |

**41.** සීමිත අනුරාධා පොදු සමාගම ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ නිෂ්පාදනය කර විකුණනු ලබයි. ගනුදෙනුකරුවෙකුට විකුණන ලද දෝෂ සහිත භාණ්ඩ සම්බන්ධයෙන් නඩුවක් 2021.03.31 දිනට විභාග වෙමින් පැවතුණි. නීති උපදෙස්වලට අනුව සමාගම විසින් මේ සඳහා රු. 50 000 ක ප්‍රතිපාදනයක් 2021.03.31 දින සිදුකරන ලදී. 2021.04.25 දින, උසාවිය විසින් රු. 75 000 ක වන්දියක් ගනුදෙනුකරුට ගෙවන ලෙස සමාගමට නියෝග කරන ලදී. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට සමාගමේ අධ්‍යක්ෂවරු විසින් 2021.05.15 දින අනුමැතිය ලබාදෙන ලදී.

(අ) LKAS 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව මෙම නඩු තීන්දුව නිසා පැන නගිනු ලබන්නේ ගළපන සිද්ධියක් ද නොගළපන සිද්ධියක් ද යන්න සඳහන් කරන්න.

............................................................................................................

(ආ) LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව මෙම නඩු තීන්දුවට අදාළව 2021.03.31 දිනට හඳුනාගත් වගකීම: රු. ..............................

**42.** සීමිත චතුරිකා පොදු සමාගමේ 2021.03.31 සහ 2020.04.01 දිනයන්ට පහත ශේෂ පැවතුණි.

| | 2021.03.31 දිනට (රු.'000) | 2020.04.01 දිනට (රු.'000) |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 7 500 | 5 000 |
| රඳවාගත් ඉපැයුම් | 4 000 | 2 500 |

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ලාභය රු. 3 500 000 ක් වූ අතර සමාගම විසින් රු. 500 000 ක අතුරු ලාභාංශ වර්ෂය තුළදී ගෙවන ලදී. තව ද 2021.03.31 දිනෙන් අවසන් වසර තුළ සමාගම විසින් රඳවාගත් ඉපැයුම්වලින් කොටසක් ප්‍රාග්ධනිත කරන ලද අතර, මහජන කොටස් නිකුතුවක් ද සිදුකරන ලදී. ව්‍යාපාරයේ හිමිකමට බලපානු ලබන වෙනත් කිසිදු ගනුදෙනුවක් නොවිය.

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ හඳුනාගන්න:

(අ) ප්‍රාග්ධනිත කරන ලද සංචිතවල වටිනාකම : රු.'000 ..............................

(ආ) මහජන කොටස් නිකුතුවේ වටිනාකම : රු.'000 ..............................

[එකොළොස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**43.** 2018 වර්ෂයේ හඳුන්වාදෙන ලද මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ගතිලක්ෂණ දෙක, අදාළ බව සහ .................................. වේ.

B - අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සම්පත් පවරාදීම සඳහා ඇති .................................. වගකීමක් ලෙස නිර්වචනය කෙරේ.

C - ඓතිහාසික පිරිවැය සහ .................................. ලෙස, මිනුම් කිරීමේ පදනම් පුළුල්ව වර්ග කරනු ලබයි.

D - ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමේ හැකියාව සඳහා ඇති අයිතිය .................................. ලෙස නිර්වචනය කෙරේ.

**44.** සීමිත සුරංග පොදු සමාගම, දේශීය වෙළෙඳපොළේ යන්ත්‍ර විකුණනු ලබයි. එම යන්ත්‍ර ස්ථාපනය කිරීම සඳහා විශේෂඥ දැනුම අවශ්‍ය බැවින් එම කාර්යය සමාගම විසින්ම කරනු ලැබේ. මෙම එක් යන්ත්‍රයක විකුණුම් මිල සහ ස්ථාපනය කිරීමේ ගාස්තුව පිළිවෙළින් රු. 3 000 000 ක් සහ රු. 400 000 ක් වේ. 2021.03.01 දින සමාගම විසින් යන්ත්‍ර 05 ක් විකිණීම සහ ස්ථාපනය කිරීම සඳහා ගිවිසුමකට එළඹෙන ලදී. 2021.03.31 දින වනවිට සමාගම විසින් යන්ත්‍ර 03 ක් සපයා තිබූ අතර, මෙයින් යන්ත්‍ර 02 ක් ස්ථාපනය කිරීම සම්පූර්ණ කර තිබුණි. 2021.03.01 දින මෙම ගිවිසුම සඳහා රු. 11 000 000 ක අත්තිකාරමක් සමාගමට ලැබුණි.

SLFRS 15 (ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් අයභාරය) ප්‍රමිතයට අනුව මෙම ගිවිසුම සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් අයභාරය : රු. ..................................

(ආ) 2021.03.31 දිනට නොඉපයූ අයභාරය : රු. ..................................

**45.** පහත තොරතුරු සීමිත කාවින්ද පොදු සමාගමේ 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| | රු.' 000 |
|---|---|
| විකුණුම් පිරිවැය | 420 |
| ආරම්භක තොගය | 80 |
| අවසාන තොගය | 60 |

වර්ෂයක් සඳහා වැඩකරන දින ගණන දවස් 360 ක් ලෙස උපකල්පනය කරන්න.

පහත දෑ හඳුනාගන්න:

(අ) තොග පිරිවැටුම් අනුපාතය : වාර ..................................

(ආ) තොග රැඳවුම් කාලය : දින ..................................

**46.** නිෂ්පාදන ව්‍යාපාරයක, 2021 ජූලි මාසය සඳහා අදාළ තොරතුරු පහත දී ඇත.

| | රු.' 000 |
|---|---|
| මුළු ප්‍රාථමික පිරිවැය | 4 500 |
| මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 3 000 |
| මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | 2 000 |

මෙම ව්‍යාපාරය 2021 ජූලි මාසයේදී ඒකක 10 000 ක් නිෂ්පාදනය කරන ලදී. ඒකකයක විචල්‍ය පිරිවැය රු. 600 ක් වේ.

පහත දෑ හඳුනාගන්න:

(අ) මුළු නිෂ්පාදන පිරිවැය : රු.'000 ..................................

(ආ) මුළු පිරිවැය : රු.'000 ..................................

(ඉ) මුළු ස්ථාවර පිරිවැය : රු.'000 ..................................

[දොළොස්වැනි පිටුව බලන්න.

**47.** පිරිවැය වර්ගීකරණයට අදාළව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

(අ) තොග අගය කිරීම සඳහා, පිරිවැය, ........................................................ සහ ........................................................ ලෙස වර්ග කෙරේ.

(ආ) පිරිවැය, ඒවායේ හැසිරීම මත, ........................................................ සහ ........................................................ ලෙස වර්ග කෙරේ.

**48.** නිෂ්පාදන ව්‍යාපාරයක භාවිත කරන අමුද්‍රව්‍යයක් සඳහා පහත තොරතුරු සපයා ඇත.

- වාර්ෂික ඉල්ලුම — ඒකක 3 200
- අමුද්‍රව්‍ය පිරිවැය — ඒකකයක් සඳහා රු. 800
- ඇණවුම් පිරිවැය — ඇණවුමක් සඳහා රු. 1 000
- වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය — අමුද්‍රව්‍ය පිරිවැයෙන් 20%

පහත දෑ හඳුනාගන්න:

(අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) : ඒකක ........................................

(ආ) EOQ ඇණවුම් කරන්නේ නම්, වාර්ෂික මුළු ඇණවුම් පිරිවැය: රු. ..............................

**49.** සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන අතර, එහි ඒකකයක දායකය රු. 50 ක් වේ. පහත තොරතුරු මෙම සමාගමේ ක්‍රියාකාරී මට්ටම් දෙකක් සඳහා අදාළ වේ.

| නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව | ඒකකයක මුළු පිරිවැය (රු.) |
|---|---|
| 4 000 | 100 |
| 6 000 | 80 |

පහත දෑ සඳහන් කරන්න:

(අ) මුළු ස්ථාවර පිරිවැය : රු. ........................................

(ආ) ඒකකයක විකුණුම් මිල : රු. ........................................

**50.** කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා නව යන්ත්‍රයක් මිල දී ගැනීමට වැවිලි සමාගමක් සලකා බලමින් සිටී. මෙම යන්ත්‍රයේ ගැනුම් මිල රු. 5 500 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එහි අපේක්ෂිත ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 8 ක් සහ රු. 700 000 ක් වේ. මෙම ව්‍යාපෘති වාර්තාව සැකසීම සඳහා සමාගම රු. 60 000 ක් ගෙවන ලදී. තව ද මෙම ව්‍යාපෘතිය ආරම්භයේ කාරක ප්‍රාග්ධනය ලෙස රු. 150 000 ක් යෙදවිය යුතු අතර, එය ව්‍යාපෘතිය අවසානයේදී අයකර ගත හැකිය. මෙම ව්‍යාපෘතිය නිසා වාර්ෂික මුදල් ගලායාම්වල ඇස්තමේන්තුගත ඉතිරිය රු. 800 000 ක් වේ.

ව්‍යාපෘතිය සඳහා පහත දෑ හඳුනාගන්න.

(අ) මුළු ආරම්භක මුදල් ගලා යෑම : රු. ..............................

(ආ) 8 වන වසරෙහි මුළු මුදල් ගලා ඒම : රු. ..............................

(ඉ) 1 වන වසරෙහි වාර්ෂික මෙහෙයුම් ලාභය : රු. ..............................

(ඊ) ගිලුණු පිරිවැය : රු. ..............................

* * *

## අ.පො.ස. (උසස් පෙළ) විභාගය - 2021 (2022)
## 33 - ගිණුම්කරණය
### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1 | 5 |
| 2 | 3 |
| 3 | 2 |
| 4 | 4 |
| 5 | 4 |
| 6 | 5 |
| 7 | 3 |
| 8 | 3 |
| 9 | 3 |
| 10 | 4 |
| 11 | 4 |
| 12 | 2 |
| 13 | 2 |
| 14 | 2 |
| 15 | 3 |
| 16 | 5 |
| 17 | 4 |
| 18 | 5 |
| 19 | 4 |
| 20 | 4 |
| 21 | 4 |
| 22 | 4 |
| 23 | 3 |
| 24 | 3 |
| 25 | 3 |
| 26 | 4 |
| 27 | 4 |
| 28 | 4 |
| 29 | 3 |
| 30 | 2 |

(1 සිට 30 දක්වා ප්‍රශ්නවලට සෑම නිවැරදි පිළිතුරකටම ලකුණු 04 බැගින් මුළු ලකුණු 120)

31. A - අසත්‍ය F × (01)
B - සත්‍ය T ✓ (01)
C - සත්‍ය T ✓ (01)
D - සත්‍ය T ✓ (01)

32. A - වෙනස් නොවේ – (01)
B - වැඩි වේ ! (01)
C - වැඩි වේ + (01)
D - අඩු වේ (01)

33. A - මුදල් ගෙවීම් ජර්නලය (01)
B - පොදු ජර්නලය (01)
C - විකුණුම් ජර්නලය (01)
D - විකුණුම් ජර්නලය/ පොදු ජර්නලය (01)

34. (a) රු. 558 000 (02)
(b) රු. 558 000 (02)

35. A - ඒකක (01)
B - කාලච්ඡේද (01)
C - මූල්‍ය මිනුම් (01)
D - ගැලපුම් (01)

36. A - සත්‍ය T (01)
B - සත්‍ය T (01)
C - සත්‍ය T (01)
D - අසත්‍ය F (01)

37. (a) රු. 420 000 (02)
(b) රු. 200 000 (02)

38. (a) රු. 2 000 (02)

(b) රු. 4 200 (02)

39.

(අ) ලාභ අලාභ විසර්ජන ගිණුම හර 1 800 (1)
ජංගම ගිණුම - මංජුල බැර 1 800 (1) } (02)
[illegible]

(ආ) ලාභ අලාභ විසර්ජන ගිණුම හර 800 (1)
ජංගම ගිණුම - සංජුල බැර 800 (1) } (02)
[illegible]

40. A - මූල්‍යන (01)

B - ආයෝජන / මෙහෙයුම් (01)

C - මෙහෙයුම් (01)

D - ආයෝජන (01)

41. (අ) ගලපන සිදුවීමකි (02)

(ආ) රු. 75 000 (02)

42. (අ) රු. 1 500 (02)

(ආ) රු. 1 000 (02)

43. (අ) විශ්වාසනීය නියෝජනය (01)

(ආ) වර්තමාන බැඳීම (01)

(ඇ) වර්තමාන අගය / [illegible] (01)

(ඉ) ආර්ථික සම්පතක් (01)
[illegible]

44. (අ) රු. 6 800 000 (02)

(ආ) රු. 4 200 000 (02)

45. (අ) වාර 6 (02)

(ආ) දින 60 (02)

46. (අ) රු. 7 500 (02)

(ආ) රු. 9 500 (01)

(ඇ) රු. 3 500 (01)

නිෂ්පාදන පිරිවැය , නිෂ්පාදන නොවන පිරිවැය [illegible]

47. (අ) නිෂ්පාදිත පිරිවැය සහ කාලච්ඡේද පිරිවැය / (02)

සෘජු පිරිවැය සහ වක්‍ර පිරිවැය , ප්‍රාථමික පිරිවැය හෝ පොදුකාර්ය පිරිවැය

(ආ) ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය (02)

48. (අ) ඒකක 200 (02)

(ආ) රු. 16 000 (02)

49. (අ) රු. 240 000 (02)

(ආ) රු. 90 (02)

50. (අ) රු. 5 650 000 (01)

(ආ) රු. 1 650 000 (01)

(ඇ) රු. 200 000 (01)

(ඈ) රු. 60 000 (01)

(ලකුණු 80)

| | | |
|---|---|---|
| ප්‍රශ්න අංක. | 1 - 30 | ලකුණු 120 |
| | 31 - 50 | ලකුණු 80 |
| | | ලකුණු 200 |

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්
### සිංහල මාධ්‍ය

**විද්‍යා - ගණිත**

- [ ] 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- [ ] 12-13 රසායන විද්‍යාව - 1
- [ ] 12-13 රසායන විද්‍යාව - 2
- [ ] 12-13 රසායන විද්‍යාව - 3
- [ ] 12-13 රසායන විද්‍යාව - 4
- [ ] 12-13 රසායන විද්‍යාව - 5
- [ ] 12-13 භෞතික විද්‍යාව - 1
- [ ] 12-13 භෞතික විද්‍යාව - 2
- [ ] 12-13 භෞතික විද්‍යාව - 3
- [ ] 12-13 භෞතික විද්‍යාව - 4
- [ ] 12-13 භෞතික විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 1
- [ ] 12-13 ජීව විද්‍යාව - 2
- [ ] 12-13 ජීව විද්‍යාව - 3
- [ ] 12-13 ජීව විද්‍යාව - 4
- [ ] 12-13 ජීව විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- [ ] 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 1
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 2
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 3
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 4

**වාණිජ්‍යය**

- [ ] 12 ගිණුම්කරණය
- [ ] 13 ගිණුම්කරණය
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 13 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව
- [ ] 13 ආර්ථික විද්‍යාව - 1
- [ ] 13 ආර්ථික විද්‍යාව - 2

**කලා**

- [ ] 12 සිංහල
- [ ] 13 සිංහල
- [ ] 12 දේශපාලන විද්‍යාව
- [ ] 13 දේශපාලන විද්‍යාව
- [ ] 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 12 ඉන්දියානු ඉතිහාසය
- [ ] 13 ඉන්දියානු ඉතිහාසය
- [ ] 12 භූගෝල විද්‍යාව
- [ ] 13 භූගෝල විද්‍යාව
- [ ] 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes
### English Medium

- [ ] 12 Accounting
- [ ] 13 Accounting
- [ ] 12 Business Studies
- [ ] 13 Business Studies
- [ ] 12 Eeonomics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර
### සිංහල මාධ්‍ය

- [ ] සාමාන්‍ය දැනීම
- [ ] 12 ගිණුම්කරණය - 1
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.